සැ. යු. - 2020.03.20 දින පළ වූ අංක 2,168 දරන *ගැසට්* පත්‍රයේ I:I (අ) සහ IV (අ) කොටස් පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,169 - 2020 මාර්තු මස 27 වැනි සිකුරාදා - 2020.03.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | — | පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — | අයවැය ලේඛන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 944 | දේපළ විකිණීම් ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | 945 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 අප්‍රේල් මස 17 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 අප්‍රේල් මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

## කළුතර ප්‍රාදේශීය සභාව

### ත්‍රී රෝද රථ නවතා තැබීමේ අතුරු ව්‍යවස්ථාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (vii) වැනි උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 122 වැනි වගන්තියේ විධිවිධාන අනුව කළුතර ප්‍රාදේශීය සභාව විසින් සාදන ලදුව සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1725/16 සහ 2011 සැප්තැම්බර් මස 29 දිනැති *අතිවිශෙෂ ගැසට්* පත්‍රය මගින් ප්‍රකාශිත කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1760 සහ 2012 මැයි මස 25 දිනැති *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත ත්‍රී රෝද රථ නවතා තැබීමේ ස්ථාන ඇතුලත් උපලේඛනයට පහත සඳහන් ස්ථාන ඇතුළත් වියයුතු බවට පිළිවෙලින් 2018.10.16 දින මහ සභාවේ තීරණ අංක 5-13-1, 2019.09.10 දින මහ සභාවේ තීරණ අංක 5-5-1, 2019.04.09 දින මහ සභාවේ තීරණ අංක 5-13-1, 2018.07.17 දින මහ සභාවේ තීරණ අංක 5-15-1, 2019.09.10 මහ සභාවේ තීරණ අංක 5-6-2, 2019.09.10 මහ සභාවේ තීරණ අංක 5-6-3 යටතේ හා 2019.08.13 මහ සභාවේ තීරණ අංක 5-4-1 යටතේ කළුතර ප්‍රාදේශීය සභාව විසින් අනුමත කර ඇති බවත් නවතා තැබිය හැකි උපරිම ත්‍රීරෝද රථ සංඛ්‍යාව ඇතුලත් උපලේඛනයට පහත සඳහන් ස්ථාන ඇතුලත් විය යුතු බවට 2020.01.14 දින මහ සභාවේ තීරණ අංක 5-11-2 යටතේ හා 2020.02.11 දින මහ සභාවේ තීරණ අංක 5-1-5 යටතේ කළුතර ප්‍රාදේශීය සභාව විසින් අනුමත කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

සංජීව ආරියරත්න,
සභාපති,
කළුතර ප්‍රාදේශීය සභාව.

2020 මාර්තු මස 04 වැනි දින,
කළුතර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු අංකය* | *නවතා තබන ස්ථානය* | *එකවර නවතා තැබිය හැකි ත්‍රීරෝද රථ සංඛ්‍යාව* |
|---|---|---|
| 01. | පොහද්දරමුල්ල ඕෂන් ක්වීන් හෝටලය අසල | 02 |
| 02. | පොතුපිටිය උතුර ගාළුපාර | 01 |
| 03. | මහ වස්කඩුව, ක්ලබ් වස්කඩුව හෝටලය ඉදිරිපිට | 02 |
| 04. | නාගොඩ ගල්ලස්සපුර අයි. ඩී. එච්. පාරේ මාතෘ රෝහල ඉදිරිපිට | 02 |
| 05. | හීනටියන්ගල පාර සව්සිරිපුර මාර්ගය අසල | 03 |
| 06. | නාගොඩ මහ රෝහලේ ජල ටැංකිය ඉදිරිපිට මාර්ගය | 02 |
| 07. | නුගගොඩවත්ත මාර්ගය අසල මාර්ගය | 02 |

03-946

---

## නිවිතිගල ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

2019.06.07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි මා විසින් පළකරන ලද දැන්වීම අනුව පහත උපලේඛනයේ සඳහන් මාවත් නිවිතිගල ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීම සම්බන්ධව විරෝධතාවන් ඉදිරිපත් කර නොමැති බැවින්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (3)(1) වැනි උප වගන්තිය ප්‍රකාර එම මංමාවත් නිවිතිගල ප්‍රාදේශීය සභාව සතු මංමාවත් ලෙස ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව.

2020 මාර්තු මස 05 වැනි දින,
නිවිතිගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| පාරේ | නම | දිග | පළල |
|---|---|---|---|
| 01. | පොල්වත්ත ගෙපල මාර්ගය | කි.මී. 2.8024 | අඩි 8 |
| 02. | කෝට්ටේ ගංගොඩ පාර | කි.මී. 1.0949 | අඩි 8 |
| 03. | එගොඩ නිවිතිගල පාර | කි.මී. 1.8111 | අඩි 8 |

03-927

---

# විවිධ දැන්වීම්

## වෙංගලචෙට්ටිකුලම් ප්‍රාදේශීය සභාව ත්‍රීරෝද රථ නැවතුම් පොළවල් සඳහාවන ගාස්තුව

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තිය සමඟ කියවිය යුතු 148 වන වගන්තියේ පැවරී ඇති පහත (1) වෙන්ගලචෙට්ටිකුලම් ප්‍රාදේශීය සභාවේ අංක VCK/2020/02/23/433 අංක හා 2020.02.11 වන දිනැති සභා තීරණයන්හට අනුකූලව වෙංගලසෙට්ටිකුලම් ප්‍රදේශය තුළ 2020 වර්ෂයේ පළමුවන තීරුවේ සඳහන් වන නැවතුම් පොළවල් සේවා සැපයීමටත් 2 වන තීරුවේ සඳහන් වී ඇති ගාස්තු 2020 ජනවාරි මස 01 වැනි දින සිට වෙන්ගලසෙට්ටිකුලම් ප්‍රාදේශීය සභාවේ කාර්යාලයේ ගෙවිය යුතු බව මෙයින් දන්වනු ලැබේ.

ඒ. ඇන්තනි,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
වෙන්ගලචෙට්ටිකුලම්.

**තීරුව 01,**
ත්‍රිරෝදරථ නැවතුම්පොළ.

1. සෙට්ටිකුලම් මූලික රෝහල් ආපන ශාලාව ඉදිකිරීමට මුහත්තාන්කුලම් 6 වන හරස් වීදියට වම්පස පිහිටි මැදවච්චිය- මන්නාරම ප්‍රධාන මාර්ගයේ මීටර් 10ක්
2. සෙට්ටිකුලම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රධාන දෙරටුවෙන් මීටර් 20ක දුරින් මීටර් 10ක්
3. සෙට්ටිකුලම් මහජන බැංකුව ඉදිරිපිට වම්පසින් මීටර් 05ක
4. සෙට්ටිකුලම් සමෘද්ධි බැංකුව ඉදිරිපිට වම්පසින් මීටර් 05ක
5. ආණ්ඩියාපුලියන්කුලම් - මන්නාර් - මැදවච්චිය ප්‍රධාන මාර්ගයට යාබදව මීටර් 08ක්
6. මාන්කුලම් - මරදම්මඩු මාර්ගයේ හංදිය සිට මීටර් 20ක දුරක ප්‍රමාණය
7. විරපුරම් - නේරියකුලම් - වවුනියා ප්‍රධාන මාර්ගයේ උතුම් මවුතුමියගේ ශුද්ධ වූ පිළිරුව හංදිය සිට වම්පසින් මීටර් 10ක දුර ප්‍රමාණයක්
8. සුඩුවෙන්දපුලවු - පාසලේ ප්‍රධාන දෙරටුවට දකුණු පසින් වවුනියාව - නේරියකුලම් ප්‍රධාන මාර්ගයේ මීටර් 10ක දුර ප්‍රමාණයක්
9. මුදලියාර්කුලම් - 03 වන පටුමගට වම්පසින් කඩ සංකීර්ණයට නුදුරින් මැදවච්චිය මන්නාරම ප්‍රධාන මාර්ගයේ මීටර් 10ක දුර ප්‍රමාණයක්
10. පරමනාලන්කුලම් - වවුනියා - මන්නාරම ප්‍රධාන මාර්ගයේ පෙරියතම්පනෙයි හංදිය සිට දකුණු පසින් මීටර් 10ක ප්‍රමාණයක්

**තීරුව - 02**

01. ත්‍රිරෝද රථ (දිනකට) 10.00

03 - 908

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.